# පහන් වැට



## කැන්ගරු දේශයේ සඳ

**පොසොන් පෝදා රෑ බැලුවෙමි පිටත**
**නමවෙනි මහලේ කවුළුව තුලින්**
**විදුලි එලියෙන් දිදුලන විසල් නගරය මැද**
**ඈත අහසේ පායා තිබේ පුර හඳ**

**සිත් නිවාලන මුදු සඳ කිරණ**
**අබිබවා නැගේ නිවී දිදුලන විදුලි එළි**
**සඳ එළිය දියාරු වී ගොසිනි**
**අපේ ජීවිත වාගේම**

**මිණි මුතු යට වී ගොම රිටි මතුවන**
**කැන්ගරුවන්ගේ දේශයේ**
**කට ඇතොත් මොලය නැතත්**
**බැබලෙන්නට හැකි කල**
**අපේ අපේ හඳ**
**නුඹ ගැන කියනුම කවරේ ද?**

**ශ්‍රියානි පෙරේරා**
**මෙල්බර්න්**

## ආදර අම්මා

මවක මෙන් දාසියන්
සියක් වට වූ නමුදු
මවක් දෙන උණුහුමක්
කෙසේ ලබනෙද දුවෙකු

**ෆැස්ලාන්**
බෙරික්

## පිය වලප



අපි යුද්දෙ ඕනෙ කිව්වද...........
උඹලට වෙන රටක් දෙන්න එපා කිව්වද...........
සාම ගිවිසුම ඉරමු කිව්වද...........
දෙමළ පෙති ගසමු කිව්වද...........
ඒත් ගැත්තෙම්...........
සෙයිලමේ මහපාරෙ
උස්සා පුවරු කෑ ගසා
පිටරට ඇත්තන්ට යන්න කීව්වද...........

සිඹිමන් රාස්සිගෙ අපි රැල්ලෙ රස
බඩ ඉරිතු කරලින් පුරවා කුස
ප්‍රෝටීන් සපිරි නෙස්ටමෝල්ට් සිහිනෙන් දැක
බී එක උගුරට කලයෙන්...........
පුරවා වතුර පොල්කටුව
ගතට ලේ බිඳු එකතු කරමින්
පොල් අතු වහලේ ඉස්කෝලෙට ගිය
මගේ අසරණ ඇටසැකිලි පුතු
ඇයිද රකුසනි නසා දැම්මේ........

කියම් කවියක් තුරුල් කර නුඹ
කෑ ගසා මම...........
වියරුවෙන් හොට දුකින් අඬමින්
ගලා හැලෙනා රුහිරු මත සිට...........

බිඳෙන් බිඳ ගල් ගැහී පොළවට
උරා රතු ලේ මතුවෙයන් වී
රනින් කඩුවක්...........
ඒ තුඩෙන් හෙට පිපී මල් ඉති
වෙයන් ලස්සන සුදු මලක්
වියරු වී ලේ බොමින් දඟලන
ජාතිවාදය නසාලන්නට..........
හෙට දිනේ උපදින එවුන්හට
සිනාසෙන්නට..........

ලක්ෂ්මන් කොඩිතුවක්කු

## හිම් සඳේ

මල් කඩලා පෙති ඉහින්න
දෑත් පටලවා හිඳින්න
කෝල බැලුම් බෑ හෙලන්න
වගකීමෙන් ඔළුව බර වෙලා

ආදරයෙන් පුතු රකින්න
යහමඟ වෙත ඔහු යවන්න
ඔබ එන මඟ බලා ඉන්න
මසිත හුරු වෙලා

නෙත් දල්ලා බලා ඉන්න
සිත පුරවා සතුටු වෙන්න
පුංචි පැලට එළිය දෙන්න
රන් රුවනක් අපට හිම් වෙලා

**චන්ද්‍රානි රාජකරුණා**
තෝමස්ටවුන්

## නමෑමි නමෑමි නමෑමි

බුදුනු කිතුනු බොහොමදාන
හින්දු දෙමල අභිමන් දන
පිඩක හෙලා බොරුව ගැලුන
ලක්මව රැක ගන්න බැව්න

තමා වටා සැප දිලිසෙන
වෙස් මුහුනක ඇස් නටවන
දැයට වැදෙන හෙන නොඇසෙන
ධනයෙ බලෙන් නොමැරෙන දන

ගැසුවා කතිරෙ දොන් ජුවන්ට
පෘතුගාලේ රජු වඳින්ට
කුමුරු මොටද පිදුරු කන්ට
පිපිඤ්ඤ්කදාම රට යවන්ට

මිලේනියම් සිටි ගැලපෙද
හීලෑ කල කොටි ඇති සඳ
තුනෙක් දෙකක් උන් ගත්තද
ඉතිරිය එක අපිට මදිද

දකුණු කොනේ කතරගමින්
අවසර ගෙන සුරිඳුන්ගෙන්
ඇවිත් කොළඹ පා ගමනින්
දියත් කලෝ ඔටුනු සටන්

බලගතු රටවල් මුලදින්
පරගැති ජන කන්ද වලින්
කොටියා කල රැවටීමෙන්
ස්වප්න වුනා පැතු සිහසුන්

**ප්‍රේමසිරි ගුණතිලක**
රෝස්හිල් සිඩ්නි

සංස්කරණය
මෛත්‍රී ප්‍රසාද් ජයවර්ධන

## සොනායා

අම්මා මමයි දුවේ නුඹ මගෙ ප්‍රාණයයි
කිරි සිනා හඬලයි සංසාරේ නේක දුක් නිමවෙයි
තරු දෙනෙත් පොපියයි මගෙ ජීවිතය ජීවත් කරවයි
හැම සුසුම් අහුලයි පපුතුරේ උණුහුමට ගුලිවෙයි

පුංචි පා පොඩි දඟයි අකීකරු සමනලිය නුඹයි
ජීවිතය නම් මෙයැයි කියා දුන්නා නම් ඒ නුඹයි
මමයි නුඹෙ පියයි මේ සතුට දුන්නාට නුඹට ණයයි
ආත්ම ගණනක් යළිත් අප උපදියි එහැම භවයෙම නුඹ අපෙයි

**චාන්දනී කුලතුංග**
ක්‍රයිස්චර්ච් නවසීලන්තය



## අවසානය

ඔබ එදත් අද රළුයි
මා සවන් යුග පෙලයි
මුදු ගීත පෙර ගැයූ අද කොහෙද සැඟවුනේ?
මේ කඳුළු බිඳු මගෙයි
මේ සුසුම් වැල් මගෙයි
දුක් වෙන්න මේ ලෙසේ අප ඇයිද හමුවුනේ?

සුවඳේ මල් පෙති රහසේ
සිහිනයන් බොඳ වෙලා
බාඳුරා කපුරු මල් ගොමුවේ
මා අතරමං වෙලා!

සීත පවන් රැලි මැකිලා
කෙම් බිමක සහන සුව හිඳිලා
තුන් හිතක නොසිතු පැතු විලසේ
ඔබ මිරිඟුවක් වෙලා!

රසික සූරියආරච්චි pemgee.blogspot.com

## තනි මල

අතින් අතට මාරුවෙමින් ගිය
මල් වට්ටි දහසකින්
වෙහෙර ගේ ගොඩ ගැසෙයි

හෙට උදේ නුඹ අවුත්
පිසදමා මල් අස්න
හලයි පර මල් ඉවත
අලුත් මල් තබන්නට

මලු පුදන්නට
සුවඳ මල් නෙළු
නටු හිස්ව ඇති ගසෙහි
ඉතිරිවුණ එකම මල
රේණු සුළඟට සලා
බලන්නේ කර පොවා
වෙන මලක් ඇති කියා
ලඟපාත

අනේ තනිවුණු මලේ
නුඹේ වතගොත සොයා
ලියන්නට
බිගු නොඑන මැදියමේ
පරවුණොත් අද රෑට
හෙට උදේ නුඹ වගේ
තවත් මල් පිපේවිද
නුඹයි අවසන් කැකුළ

**චන්ද්‍රිකා ද සිල්වා**
පර්ත්

## කවිය

ජීවත් වීම නම්
හදවතත් බුද්ධියත්
නිදැල්ලේ යා නොදී
රැක ගැනීමේ සටනකි

ලිවීම නම්
මොහොතකට වාඩි වී
ආත්මයේ ඇතුලාන්තය
විනිශ්චය කිරීමකි

(ඉබ්සන් ලියූ කවි (2006) පොතෙන්)

පරිවර්තනය
**ශ්‍රියා කුමාරසිංහ**
නවසීලනිතය

## අතීතාවර්ජනා

| | |
|---|---|
| නොපැකිල හිඳින්නට වියතුන් සබා මැ | ද |
| කලඹන අදහසින් විදු නැණ කිරි මුහු | ද |
| පිය නැගූ එදා මා පිය තුටු කඳුළු මැ | ද |
| පේරාදෙණිය සිහිනයකැයි සිතෙයි අ | ද |
| මිහිදුම් සලු පෙරවි කඳුපෙල හන්තා | නේ |
| පාමුල පටන් ඈතට යන නෙත් මා | නේ |
| නඳුනුයනටත් වැඩි රමණීය හඳපා | නේ |
| සරසවි උයන ඉම හිඳගල ගම්මා | නේ |
| රතු මල් ගැවසී මැයි ගස් සැදි මග දෙප | සේ |
| රතදර සැරසී නා රුක් පෙල උසට උ | සේ |
| රන් මල් පැළඳි මහ ලිය මඩුලු නුබ කු | සේ |
| පල කිම බක් මහේ සරසවි නුදුටු ඇ | සේ |
| බැස යන දිය කඳින් මහවැලි ගංතී | රේ |
| නිති පුද ලබන ගැටඹේ රජ මහ වෙහෙ | රේ |
| සතපා මදක් දුක්බිය ගොරතර සස | රේ |
| පෝදා සැඳෑකල හේව්සි හඬ පැති | රේ |
| වළඳන අදහසින් නිවනේ පරම සු | වේ |
| රෑබර යුවති දෑතින් තෙල් පහන් දැ | වේ |
| බෝ සෙවණේ සරන මා සිත නෙත් අඳ | වේ |
| අනිමිස ලෝචනය දුමිඳුන් දෙසට නො | වේ |
| අයාලේ ගෙවන දිවියේ සැඳෑ ස | මේ |
| සමනල් යුගේ දහසක් මල් පිපුණු බි | මේ |
| සුවඳින් ඔබ මතක මා පොබකල මහි | මේ |
| සපුමල් සුවඳ මෙනි සීතල රෑ යා | මේ |

**මොරගොඩ මලියසේන**
කැන්බරා නුවර